# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022
2025 ජූලි

මානවශාස්ත්‍ර පීඨය

සිංහල
(නව නිර්දේශය)

**ශිලා ලේඛන, සංස්කෘතිය හා ජනශ්‍රැතිය SINH 38224**


පළමුවන කොටසේ පළමුවන ප්‍රශ්නය හා තවත් එක් ප්‍රශ්නයක් ද දෙවන හා තෙවන කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් බැගින්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.


**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**


---


## 1 කොටස


01. අ) පහත සඳහන් ශිලා ලිපි කියවා වර්තමාන සිංහල අකුරින් ලියන්න.

i. 

ii. 

iii. 

iv. 

v. 

(ලකුණු 05 යි)

ආ)	පහත සඳහන් ශිලා ලේඛන පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.

දෙ(ව)නපිය - මහරඣහ බරියය බකි(නිය) උපශික - වරුණ (දත)ය (ලෙ)ණෙ

මහරඣහ ගමණි - තිශශ බරිය උපශික - කිතකය ලෙණෙ ශගශ

කණගම -ර (ඣශ) තිශහ ඣිත ශවෙර - ශමණිය ලෙණෙ ශගශ

ගමණි - උති- මහරඣහ - (ඣිත අබි ති)ශය ලෙණෙ දශ දිගශ සගයෙ දිනෙ

බඩගරික - ගමික - අනුඩිය ඣිත උපශික - තිශය ලෙණ ශගශ	(ලකුණු 05 යි)

ඇ)	ස අමණක උදි ඉච බයලි දස අමණ ඉච මෙ දෙ හකඩ දස අ-
-මණක වී පිටදඩ-හසහි වෙඪ අකල-හසහි වෙඪ ම-
-දෙ-හසහි වෙඪ පචවිසිය අමණක වී ඉච මෙ ස අමණක උදිහි
වෙඪ එක අමණ දෙ පෙකඩක උදි ඉච දස අමණක බයලිහි වෙඪ
දෙ අ-
-මණ දෙ පෙකඩක බයලි ඉච මෙ වතක වණහි ගහෙ කිණිය
විටවය වෙ-
ඪ ගෙණ තිණඩ හකට දන-වට ඉච අතරකජක-වට ඉච අතරකජ
(පරි)කර-යපෙනි ඉච දි මිය වට පෙණි තිල ඉච බුනතෙල ඉච
ලොණ ඉච
පලහ-වට ඉච වෙටයල ඉච	(ලකුණු 06 යි)

ඈ)	අබහය්ගිරි වෙහෙර්හි
ඉසා සෙය්ගිරිවෙහෙර්හි ඉසා බද්තුවාක් ඇත්වෙහෙර
ගම්බිමට් ඉසා මෙහි මෙ අබැදි තුවක් වෙහෙර්හි ඉසා
රජ් මහ වෙහෙර්හි ඉසා පිරිවෙන්හි ඉසා පියන්ගල්හි ඉසා
මෙහෙණිවර්හි ඉසා සඟ් සතු පුගුල් සතු ලාහ
යෙහි ඉසා බජ් තුවාක් ගම් බිමට් රජ්කොල්කැමියන් වැදැ
වැරියන් ගැල් ගොන් මීවුන් නොගන්නා ඉසා ගස්කො
ළ් නොකපනු ඉසා මෙලාට්සී නොවද්නා ඉසා
මිනීකෙටූකෙනෙකුන් ඇත ගමට් වැදූ ඔවුන්මැ ඉල්ලත් මුත්
සෙසු එහිනොපහළ් සෙසුකුඩිනට් අනියා නොකරනු ඉසා
දෙදෙහවුරුද්දෙන් ගොස් රජ්කොල්සම්දරුවන් රට් ඉල්ලා
(පස්) මහාසාවද්ද වරජ් ඉල්ලත්මුත් සෙසුවරද් නොඉල්ලනු
ඉසා පෙරෙකැමියන් ගම් දන්නා සෙ දඩ් ගෙනැ
පැවිවු වරදට් වටාලා දඩ් නොගන්නා ඉසා ඇත්වෙහෙර
ගම්බිමන් ගත් හැමදඩ් ඇත්වෙහෙර කම්න
වාමට් දෙනු ඉසා පෙර නොවන් විරි තැනට් පෙරෙනාට්ටියම්
නොවද්නා ඉසා	(ලකුණු 08 යි)

ඉ)	ලී දඬට් සවාමී ගිනු
ත් මීසැ අබුදරු-
-වන් වැලැක්මෙ නො
-ගන්නා ඉසා ගම-
-ට් ආ රදොලන් රහ-
-මස් දී ගිතෙල් නො-
-ගන්නා ඉසා වතු-
-පෙත් වෙත් වැදූ රහ
නො ගන්නා ඉසා
සොරවෙළඳම් (නො)
කරනු ඉසා පොහො-
දා සල්කළාකුගෙ-
-න් වැපුදයට් තෙ-
-ල් පද්දක් ගන්නා
ඉසා මියුගුණ් ම-
-හ වෙහෙර වැපුද
පවත්වනු ඉසා වැ-
-පුදයට් නොලැබුණා-
-කුගෙන් පෙරෙසිරිත්
දඬ වැපුදයට්
ගන්නා ඉසා	(ලකුණු 08)

ඊ) නො පොහොත් (ගෙ)දඩ් ගන්නා
කොට් ඉසා ගෙදඩ් නැත අත් කපා පට්වනු කොට් ඉසා
වූ දඩ් සිහින් දඩ් පෙරෙ සිරිත්සෙ ගම්ලද්දන් පමුණු
(ලද්දන් බෙදා) ගන්නා කොට් ඉසා මීවුන් ගෙරිගොන් එළු
වන් මැරුවන් මරා පට්වනු කොට් ඉසා නොමරා සොරා
ගෙනැ ගිය නියත කොට් ඔවුන් ඔවුන් කසිලැ සන්ල
කුණ් ඔබා හර්නා කොට් ඉසා තිරැ නො වත් කොටා පට්ව
නු කොට් ඉසා බැහැරින් ඇරැ විකුණන මීවුන් ගෙරි
ගොන් එළුවන් හැන්දිනැ ඇපැ ගෙනැ ගන්නා කොට් ඉසා
අණ මැකුවන් රත්කළ යමර වැඩි(ෙ)ය සිට්වනු කො
ට් ඉසා මෙ දස ගැ(මැ කුඩීන්) තමන් තමන් කුලෙහි (වැ
ටෙ)න මඟුලවමඟුල වලන්ද්නා පැරහැර නො ඉක්මැ
වැටෙනු කොට් ඉසා (ලකුණු 08)

02. බ්‍රාහ්මී අක්‍ෂර මාලාවේ සම්භවය පිළිබඳ ව විමසීමක් කරන්න.

03. අතීත ලංකාවේ සැබෑ සමාජ පැතිකඩක් හඳුනාගැනීමෙහිලා ශිලා ලේඛනවලින් ලැබෙන පිටිවහල කෙබඳුදැයි නිදර්ශනාශ්‍රයෙන් පැහැදිලි කරන්න.

04. පහත සඳහන් ශිලා ලේඛන අතරින් එකක් (01) පිළිබඳ ව ප්‍රාමාණික විග්‍රහයක් කරන්න.

අ) තෝණිගල ගිරි ලිපිය

ආ) බදුලුටැම් ලිපිය

ඇ) වේවැල්කැටිය පුවරු ලිපිය

## II කොටස

05. භෞතික හා අභෞතික අංශ කෙරෙහි විශේෂාවධානයක් යොමු කරමින් සංස්කෘතිය පිළිබඳ ව විශ්ලේෂණාත්මක විග්‍රහයක් කරන්න.

06. උප සංස්කෘති සංකල්පය පැහැදිලි කොට ඒවා බිහිවීමට බලපාන සාධක පිළිබඳ සමාලෝචනයක් කරන්න.

07. (අ) 'සිංහල සංස්කෘතියෙහි ශ්‍රේෂ්ඨතම අංගය ලෙස සැලකිය යුත්තේ වැවිය.' පූර්වෝක්ත මතයෙහි යුක්තියුක්තතාව සාකච්ඡා කරන්න.

නැතහොත්

(ආ) බ්‍රිතාන්‍ය සංස්කෘතික සම්පර්කය හේතුවෙන් සිංහල සංස්කෘතියේ ඇති වූ සාධනීය හා නිෂේධනීය වෙනස්කම් කවරේදැයි නිදසුන් ඇසුරින් විභාග කරන්න.

## III කොටස

08. විවිධ නිර්වචන ඇසුරු කර ගනිමින් ජනශ්‍රැති සංකල්පය පැහැදිලි කරන්න.

09. පැරණි සිංහලයන්ගේ ජන ජීවිතය හා සත්ත්ව ප්‍රජාව අතර පවතින සබඳතාව සත්ත්ව ශ්‍රැතියෙහි කවරාකාරයෙන් සටහන්ව ඇති දැයි නිදර්ශනාශ්‍රයෙන් විභාග කරන්න.

10. මානව චරිතවල පවතින විවිධ විෂයක දුර්වලතා උස්-පහත් භේදයකින් තොරව විවේචනය කිරීමට හාස්‍යෝත්පාදක ජනකතා රචකයන් දැක්වූ කුසලතාව නිදසුන් සපයමින් අගයන්න.

(02 සිට 10 දක්වා සෑම පිළිතුරකට ම ලකුණු 15 බැගින්)

************************